# බුදුන් වදාල ධර්මය

## සත්බුදු වන්දනාව

## *සාදු සාදු බුදු රුවණ වඳින්ටයි...............................*

### අප භාග්‍යවන්ත වූයෙමු............

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

කලාතුරකින් මේ ලෝ තලයෙහි පහළ වන ආශ්චර්යවත් මනුෂ්‍ය රත්නයන් ගැන, පරම දුර්ලභ වූ මනුෂ්‍ය රත්නයන් ගැන අහන්න තරම් අප මේ ජීවත්වන යුගය වාසනාවන්තයි. අබුද්ධෝත්පාද කාලයක අපි ඉපිද සිටිද්දී කිසිසේත් දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් හෙබි සම්බුදු රජාණන් වහන්සේලා ගැන අපට අහන්නට ලැබෙන්නේ නෑ. මාර්ග ඵල ලාභී ශ්‍රාවකයින් ගැන අපට අහන්නට ලැබෙන්නේ නෑ. නමුත් පින්වතුනි, මේ යුගයේ උපන් අපි සැබවින් ම භාග්‍යවන්තයි. අපිට ඒ බුදුරජාණන් වහන්සේලා ගැන ගුණ වශයෙන් අහන්න ලැබෙනවා. ඒ බුදුරජාණන් වහන්සේලා කවර කවර ඥාණයන් ගෙන් සමන්විතව වැඩ සිටියාදැයි අපට අහන්න ලැබෙනවා. ඒ බුදුරජාණන් වහන්සේලා ගේ ළයෙහි උපන් කරුණාව මොන තරම් පරිපූර්ණ දැයි අපට අහන්නට ලැබෙනවා. ඒ බුදු කරුණාවේ සිසිළස ලැබූ අනන්ත අප්‍රමාණ ජනකායක් සසර දුකින් මිදුනු වග අපට අහන්නට ලැබෙනවා.

එවන් බුද්ධ රාජ්‍යයන් ඉතාමත් කළාතුරකින්, වරින් වර ලෝකයේ පහළ වෙනවා. ඒ පහළ වීම අතිශයින් ම දුර්ලභයි. පින්වතුනි, බුදුරජාණන් වහන්සේලා ගේ යුගයන් ගැන කථා කිරීමේදී අපි කථා කරන්නේ කල්ප වලින්.

### කල්පයක් යනු කොතරම් දීර්ඝ කාලයක් ද?

දවසක් බුදුරජාණන් වහන්සේ ගෙන් භික්ෂූන් වහන්සේ නමක් අහනවා;

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! කල්පයක් යනු කොයි තරම් දීර්ඝ කාලයක් ද කියලා වර්ෂ වලින් කියන්න පුළුවන්ද?"

බුදුරජාණන් වහන්සේ පිළිතුරු දුන්නා "පින්වත් භික්ෂුව! කල්පයක ට මෙතරම් වර්ෂ තියනවා, මෙතරම් වර්ෂ ලක්ෂයක් තියනවා, දස ලක්ෂයක් තියනවා, කෝටියක් තියනවා, කෝටි දස ලක්ෂයක් තියනවා කියලා කල්පයක දීර්ඝ කම කියන්න බෑ" කිව්වා.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! කල්පයක දිග මේ සා දීර්ඝ බව වර්ෂ වලින් කියන්න බැරි නම්, භාග්‍යවතුන් වහන්ස කල්පය කොයි තරම් දිග ද කියලා උපමාවකින් කියන්න පුළුවන් ද?" කියලා ඇහුවා.

බුදුරජාණන් වහන්සේ වදාලා යොදුනක් දිග, යොදුනක් පළල, යොදුනක් උස ගල් පර්වතයක් තියනවා (යොදුනක් කියන්නේ සැතපුම් හතක්). බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අවුරුදු 100 කට වතාවක් කෙනෙක් සිනිඳු සේලයකින් මේ ගල් පර්වතය පිසදානවා. කාලයක් ඇවෑමෙන් මේ ගල් පර්වතය පොළව මට්ටමට ගෙවෙනවා. මහණෙනි, ඒත් කල්පය අවසන් නෑ. එතකොට පින්වතුනි, මේ සා දීර්ඝ කාලයක් කල්පයක ට තියනවා.

## <u>පැතූ පමණින් බුදු බව ලැබෙනවා නම් හය මාසෙන් හය මාසෙට බුදුවරු......</u>

ඉතින්, එවන් කල්ප මුණ ගැසෙනවා සත්ත්වයා ට බුද්ධ ශුන්‍ය කල්ප. ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේලා නෑ. නමුත්, පින්වතුනි සත්‍යය ඒක වුනාට ජපානයේ, කොරියාවේ, තායිවානයේ, ටිබෙටයේ, අපේ රටේ හරියට බුදු බව පතන අය ඉන්නවා නේද? සත්‍යය මේකයි. ඔය පතන පැතිල්ල සාර්ථක වෙනවා නම් හයමාසෙන් හයමාසෙට බුදුවරු පහළ වෙනවා. නමුත් දරුවනි, යථාර්ථය ප්‍රාර්ථනය ට වඩා වෙනස් එකක්. ඒ නිසා, ඒ බුදුරජාණන් වහන්සේලා දුර්ලභ මනුෂ්‍ය මාණික්‍යයන්. අපි උන්වහන්සේලා ගේ ගුණ සිහි කරලා උන් වහන්සේලා ව වන්දනා කරමු.

එක බුදුරජාණන් වහන්සේ කෙනෙකුගේ ගුණ වලට කියනවා **අසම** කියලා. අසම කියන්නේ ලෝකයේ වෙනත් කවුරුත් සමගවත් සමාණ නෑ. හැබැයි බුදුරජාණන් වහන්සේලා ට සමාණයි. ඒ නිසා උන්වහන්සේලා ට කියනවා **අසම සම.**

ඒ බුදුරජාණන් වහන්සේලා සිහි කරලා අපි දැන් වන්දනා කරමු.

**සාදු! සාදු!! සාදු!!!**

**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

**ඉතිපිසෝ භගවා අරහං/ සම්මා සම්බුද්ධෝ / විජ්ජාචරණ සම්පන්නෝ / සුගතෝ ලෝකවිදූ / අනුත්තරෝ පුරිස ධම්ම සාරථී/ සත්ථා දේව මනුස්සානං/ බුද්ධෝ භගවාති.**

**කල්ප සියයක් ඇතුලත / ලොව පහළ වී වදාළ/ විපස්සී නම් වූ/ බුදුරජාණන් වහන්සේ ද/ සිඛී නම් වූ/ බුදුරජාණන් වහන්සේ ද/ වෙස්සභූ නම් වූ/ බුදුරජාණන් වහන්සේ ද/ කකුසඳ නම් වූ/ බුදුරජාණන් වහන්සේ ද/ කෝණාගමණ නම් වූ/ බුදුරජාණන් වහන්සේ ද/ කාශ්‍යප නම් වූ/ බුදුරජාණන් වහන්සේ ද/ ගෞතම නම් වූ/ බුදුරජාණන් වහන්සේ යන/ සත්බුදු රජාණන් වහන්සේලා/ අරහං වනසේක/ සම්මා සම්බුද්ධ වන සේක/**

විජ්ජාචරණ සම්පන්න වන සේක/ සුගත වන සේක/ ලෝක විදූ වන සේක/ අනුත්තරෝ පුරිස ධම්ම සාරථී වන සේක/ සත්ථා දේව මනුස්සානං වන සේක/ බුද්ධ වන සේක/ භගවා වන සේක

සත්බුදු රජාණන් වහන්සේලා/ අසම වන සේක/ අසම සම වන සේක/ අනාථ නාථ වන සේක/ තථාගත වන සේක/ තුන් ලෝකයෙහිම/ ආලෝකය වන සේක/ අනන්ත සිල් ඇති සේක/ අනන්ත සමාධි ඇති සේක/ අනන්ත ප්‍රඥා ඇති සේක/ අනන්ත විමුක්ති ඇති සේක/ මහා කරුණා ඇති සේක/ මහා ප්‍රඥා ඇති සේක/ මෙසේ අනන්ත වූ/ අප්‍රමාණ ගුණ ඇත්තා වූ/ සත්බුදු රජාණන් වහන්සේලා උදෙසා/ මේ පහන් ආලෝක/ පූජා කරමි පූජා වේවා/ මේ සුවඳ දුම්/ පූජා කරමි පූජා වේවා/ මේ සුවඳ මල්/ පූජා කරමි පූජා වේවා/ මේ සිසිල් පැන්/ පූජා කරමි පූජා වේවා/ මේ ගිලන්පස/ පූජා කරමි පූජා වේවා/ මේ සියළුම පූජාවෝ/ විපස්සී නම් වූ/ බුදුරජාණන් වහන්සේ ගේ පටන්/ ගෞතම නම් වූ/ බුදුරජාණන් වහන්සේ දක්වා/ ලොව පහළ වී වදාළ/ සත්බුදු රජාණන් වහන්සේලා උදෙසා/ සාදර ගෞරවයෙන්/ පූජා කරමි/ පූජා වෙත්වා/ පූජා වෙත්වා/ පූජා වෙත්වා

සාදු! සාදු!! සාදු!!!

## 01. විපස්සී බුදුරජාණන් වහන්සේ

පින්වත්නි,
මෙයට කල්ප අනූ එකකට පෙර (91) මිනිසුන් ගේ ආයුෂ අවුරුදු 80,000 යි. ඒ කාලයේ දඹදිව බන්ධුමතී නම් රාජධානියේ බන්ධුමාන නම් රජතුමා පියාණන් වෙලා, බන්ධුමතී නම් දේවිය මෑණියන් වෙලා විපස්සී කියන බුදුරජාණන් වහන්සේ මහා පුරුෂ ලක්ෂණ 32 කින් පරිපූර්ණ ව ලොව පහළ වුනා. ඒ බුදුරජාණන් වහන්සේ පළොල් රුක් සෙවණක දී චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගෙන සම්මා සම්බුද්ධත්වය ට පත්වුනා. උන්වහන්සේ ට ඛණ්ඩ/තිස්ස නමින් අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙනමක් වැඩ සිටියා. අශෝක නමින් අග්‍ර උපස්ථායක ස්වාමීන් වහන්සේ නමක් වැඩ සිටියා. උන්වහන්සේ පහළ වෙලා අනන්ත අප්‍රමාණ සත්ත්ව සංඛ්‍යාවක් සංසාර ගමණින් එතෙර කරවලා අමා නිවන් සුවය සලසා දුන්නා. ඒ විපස්සී බුදුරජාණන් වහන්සේ ට නමස්කාර වේවා!

ලොවේ ඇති හැම අඳුර නසනා - මහා නුවණැති මුණි රජාණෙනි
සදා සැනසිලි සුවය සදනා - ලොවේ අසිදිස දම් රජාණෙනි
විපස්සී යන නමින් තිලොවේ - වැඳුම් ලබනා බුදුරජාණෙනි
දෑත නළලේ තබා වඳිනා - වැඳුම් පිළිගත මැන සුවාමිනි

නසා සියළුම කෙලෙස් සතුරන් - ජය ලැබූ ලොව දම් රජාණෙනි
පළොල් රුක් සෙවනේදී බුදු රැස් - විහිදුවා ලූ බුදුරජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා - සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම - පතාගෙන ඒ අම නිවන් සුව

සාදු! සාදු!! සාදු!!!

## 02. සිඛී බුදුරජාණන් වහන්සේ

විපස්සී බුදුරජාණන් වහන්සේ ලෝකෙට පහළ වෙලා ඒ බුද්ධ ශාසනය කලක් ගතවුනාම අතුරුදහන් වුනා. කවුරුවත් දන්නේ නැතුව ගියා. ඉන් පස්සේ කල්ප හැටක් (60) බුද්ධ ශූන්‍යයි. බුදුවරු ලෝකේ නෑ. චතුරාර්ය සත්‍යය ලෝකේ නෑ. ආර්ය ශ්‍රාවකයින් ලෝකේ නෑ. මාර්ග ඵල ලාභීන් ලෝකේ නෑ. කල්ප හැටක් බුද්ධ ශූන්‍යයි. ඒ කල්ප හැටේ ඇවෑමෙන් පස්සේ ආයෙමත් සුන්දර යුගයක් ආවා.

ඒ මීට කල්ප 31 කට කලින්. එකල මිනිසුන් ගේ ආයුෂ අවුරුදු 70,000 යි. රජ පවුලක බෝසතානන් වහන්සේ උපත ලැබුවා සිඛී කියන නමින්. දඹදිව් තලයේ අරුණ රාජධානියේ අරුණ කියන රජතුමා ගේ පුතනුවන් වහන්සේ වෙලා ප්‍රභාවතී කියන බිසව ගේ පුතනුවන් වහන්සේ වෙලා සිඛී බෝසතානන් වහන්සේ ඉපදුනා.

හෙළඹ රුක් සෙවනේ දී ඒ බෝසතානන් වහන්සේ මාර සේනා පරාජය කරලා ගුරූපදේශ රහිතව චතුරාර්ය සත්‍ය ධර්මය පරිපූර්ණ වශයෙන් අවබෝධ කරගෙන සම්මා සම්බුද්ධත්වයට පත්වුනා. උන්වහන්සේ ගේ ශ්‍රාවකයින් වහන්සේලා අතර අභිභූ/ සම්භව නමින් අග්‍ර ශ්‍රාවක ස්වාමීන් වහන්සේලා දෙනමක් වැඩ සිටියා. ඛේමංකර නමින් අග්‍ර උපස්ථායකයන් වහන්සේ නමක් වැඩ සිටියා. ලොව පුරා අමා ගඟුලැලි ඇද හැළුනා. කෙලෙස් ගින්නෙන් පීඩිත වූ අසරණ දනන් තම තමාගේ දුක් තැවුල් නිවාගෙන අමා පැන් වලඳා සදා සිසිළස සලසා ගත්තා.

ඒ සිඛී බුදුරජාණන් වහන්සේ ට නමස්කාර වේවා!

හෙළඹ රුක් සෙවනේදී බුදු රැස් - විහිදුවා ලූ මුණි රජාණෙනි
බිම්බරක් දස මාර සේනා - පරදවා ලූ වීරයාණෙනි
සිඛී යන නාමයෙන් තිලොවේ - පිදුම් ලබනා බුදුරජාණෙනි
දෑත නළලේ තබා වඳිනා - වැඳුම් පිළිගත මැන සුවාමිනි

ලොවේ ඇති දුක් තැවුල් නිවනා - කාරුණික සම්බුදු රජාණෙනි
නුවණ වසනා අඳුර නසනා - මහා නුවණැති ගුණවතාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා - සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම - පතාගෙන ඒ අමා නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

## 03. වෙස්සභූ බුදුරජාණන් වහන්සේ

**පින්වත්නි,**

ඒ කල්පය සැහෙන්න වාසනාවන්තයි. ඒ සිඛී බුදුරජාණන් වහන්සේ පහළ වෙලා චතුරාර්ය සත්‍ය ධර්මය එළි පෙහෙළි කරලා ලෝ සසුණ බැබළුනා. කලක් යද්දී මේ ශාසනය අතුරුදහන් වෙලා ගියා. නමුත් ලෝකය එතරම් ම අවාසනාවන්ත නෑ. ඒ යුගයේ ආයෙමත් බුදුරජාණන් වහන්සේ නමක් පහළ වුනා. එතකොට මිනිසුන් ගේ වයස අවුරුදු 60,000 යි.

වෙස්සභූ යන නමින් ඒ බුදුරජාණන් වහන්සේ ලෝකෙට පහළ වුනේ. දඹදිව් තලයේ අනෝම රාජධානියේ සුප්පතීත කියන රජ්ජුරුවෝ පියාණන් වුනේ. යසවතී කියන බිසවුන් වහන්සේ මෑණියන් වුනේ. සල් රුක් සෙවණකදී වෙස්සභූ බුදුරජාණන් වහන්සේ ගුරූපදේශ රහිතව චතුරාර්ය සත්‍ය ධර්මය පරිපූර්ණ වශයෙන් අවබෝධ කරගෙන සකළ ක්ලේශයන් ප්‍රහාණය කරලා අමා මහ නිවණ සාක්ශාත් කරලා ඒ යුගයේ සම්මා සම්බුද්ධත්වයට පත්වුනා. ඒ බුදුරජාණන් වහන්සේටත් සෝණ/ උත්තර නමින් අග්‍ර ශ්‍රාවකයින් වහන්සේලා දෙනමක් වැඩ සිටියා. උපශාන්ත නමින් අග්‍ර උපස්ථායක ස්වාමීන් වහන්සේ නමක් වැඩ සිටියා. සකළ ලෝක සත්ත්වයා ට මහත් සැනසිල්ලක් ශාන්තියක් සැපතක් ඒ බුදුරජාණන් වහන්සේ ගේ බුද්ධ රාජ්‍යයේ දී ලෝකය ට උදාවුනා.

වෙස්සභූ බුදුරජාණන් වහන්සේ ට නමස්කාර වේවා!

වෙස්සභූ යන නමින් තිලොවේ - එළිය කරනා බුදුරජාණෙනි
සාල රුක් සෙවනේදී බුදු රැස් - විහිදුවා ලූ සිහ රජාණෙනි
සියළු ලෝ සත වෙත දයාවෙන් - නිවන් සැප දුන් බුදු පියාණෙනි
දෑත නළලේ තබා වඳිනා - වැඳුම් පිළිගත මැන සුවාමිනි

සිල් සමාහිත නුවණ පැතිරූ - වෙස්සභූ සම්බුදු රජාණෙනි
මිහිරි සදහම් සුවය සැළසූ - ලොවේ අසදිස දම් රජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා - සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම - පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

## 04. කකුසඳ බුදුරජාණන් වහන්සේ

පින්වත්නි, ආයෙමත් මහා අවාසනාවන්ත යුගයක් ආවා. කල්ප තිහක් (30) බුදුරජාණන් වහන්සේලා නෑ. බුද්ධ ශූන්‍යයි. ලොව කවුරුත් මේ ජීවිතය කුමක්ද යන වග දන්නේ නෑ. කියා දෙන්න කෙනෙකුත් නෑ. සතර අපායේ වැටෙන සසර ගමනෙන් එතෙර විය නොහැකි අනන්ත සත්ත්වයන් දුක දොම්නස වැලඳගෙන සිහිණ ලෝකෙක දුක් විඳ විඳ ගියා. ඒ තිස් කල්පයේ ඇවෑමෙන් මහා භද්‍ර කල්පය ලෝකයට ලැබුනා. පින්වතුනි, අපි මේ ගත කරන්නේ ඒ මහා භද්‍ර කල්පයේ. මහා භද්‍ර කල්පයේ දී මිනිසුන් ගේ ආයුෂ අවුරුදු 40,000 ක් වෙලා තිබෙද්දී දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් ගෙන් ශෝභමාණ වූ පින් සිරුරකින් හෙබි ලොවට ප්‍රඥාවේ ආලෝකය උදාකරන උතුම් මුණිරජාණන්, කකුසඳ බුදුරජාණන් වහන්සේ පහළ වුනා.

දඹදිව ඛේමවතී කියන රාජධානියේ අග්ගිදත්ත නම් බ්‍රාහ්මණ තුමා පියාණන් වුනා. මේ වාසනාවන්ත දරු සිඟිත්තා තම කුසේ හොවා ගන්නට තරම් මහා පිණැතියක් වුනේ විශාඛා බ්‍රාහ්මණ තුමිය. කකුසඳ බුදුරජාණන් වහන්සේ මහරි රුක් සෙවනේදී සියළු කෙළෙසුන් නසා චතුරාර්ය සත්‍යය අවබෝධ කොට සම්මා සම්බුද්ධත්වයට පත්වුනා. ඒ බුදුරජාණන් වහන්සේ ට විදුර/ සඤ්ජීව නමින් අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙනමක් වැඩ සිටියා. බුද්ධිජ නමින් අග්‍ර උපස්ථායකයන් වහන්සේ නමක් වැඩ සිටියා. කකුසඳ බුදුරජාණන් වහන්සේ මේ ලෝකයට අමා සිසිළස බෙදා දුන්නා. සැපත බෙදා දුන්නා. අවිදු අඳුරෙහි සිරවී සිටි ලෝ සතුන් ආලෝකය කරා රැගෙන ගියා.

කකුසඳ බුදුරජාණන් වහන්සේ ට නමස්කාර වේවා!

උදා හිරු ලොව දිලෙන විලසින් - ලොවට වඩිනා බුදුරජාණෙනි
මහරි රුක් සෙවනේදී බුදු රැස් - විහිදුවා ලූ දම් රජාණෙනි
නමින් කකුසඳ ලෙසින් තිලොවේ - වැඳුම් ලබනා මුණි රජාණෙනි
දෑත නළලේ තබා වඳිනා - වැඳුම් පිළිගත මැන සුවාමිනි

හඬා වැළපෙන ලොවට සැණසුම - බෙදා දෙන සම්බුදු රජාණෙනි
අමා සැප ඇති නිවන් සැප දෙන - කාරුණික සම්බුදු රජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා - සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම - පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**


BudunWadalaDharmaya1@gmail.com

## 05. කෝණාගමණ බුදුරජාණන් වහන්සේ

ඊට පස්සේ පින්වත්ති, මිනිසුන් ගේ ආයුෂ කෙමෙන් කෙමෙන් අඩුවෙනවා. මේ මහා භද්‍ර කල්පයේ ම මිනිසුන් ගේ ආයුෂ අවුරුදු 30,000 වෙලා තිබෙද්දී ආයෙමත් පින්බර යුගයක් ලොවට උදා වුනා. කෝණාගමණ නමින් බුදුරජාණන් වහන්සේ නමක් ලොවට පහළ වුනා. දඹදිව් තලයේ සෝභවතී කියන රාජධානියේ දී යඤ්ඤදත්ත නම් බ්‍රාහ්මණ තුමා පියාණන් වෙලා උත්තරා නම් බ්‍රාහ්මණ තුමිය මෑණියන් වෙලා මේ වාසනාවන්ත සිඟිති බෝසත් පුතා ලොවට ලැබුනා. ඒ කෝණාගමණ බුදුරජාණන් වහන්සේ දිඹුල් රුක් සෙවනේදී සියළු කෙලෙසුන් නසා තමන් වහන්සේ තුල උපදවා ගත් ගුරුපදේශ රහිත වූ නුවණින් සකළ ලෝකයම ජයගෙන සම්මා සම්බුද්ධත්වයට පත්වුනා. උන්වහන්සේ ට භීයොා්ස/ උත්තර නමින් අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙනමක් වැඩ සිටියා. සොත්ථිජ නමින් අග්‍ර උපස්ථායකයන් වහන්සේ නමක් වැඩ සිටියා. ලොවට මහත් සැණසිල්ලක්, ආලෝකයක් උදාවුනා. සතර අපායෙහි වැටි වැටී සිටි නුවණැති මිනිසුන් එයින් අත්මිදුනා. මඟ ඵල නිවණ ට පත්වුනා. අමා සැපය ලැබුවා.

කෝණාගමණ බුදුරජාණන් වහන්සේ ට නමස්කාර වේවා!

දෙව් මිනිස් ලොව එළිය කරනා - මහා නුවණැති මුණි රජාණෙනි
දිඹුල් රුක් සෙවනේදී බුදු රැස් - විහිදුවා ලූ දම් රජාණෙනි
නමින් කෝණාගමණ ලෙස ලොව - වැඳුම් ලබනා ගුණවතාණෙනි
දෑත නළලේ තබා වඳිනා - වැඳුම් පිළිගත මැන සුවාමිනි

මහා කරුණා නෙතින් බලනා - කාරුණික සම්බුදු රජාණෙනි
වලාකුළු නැති අහසෙ දිලෙනා - සුපුන් සඳ වන් පින්වතාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා - සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම - පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

## 06. කාශ්‍යප බුදුරජාණන් වහන්සේ

පින්වත්නි, ඒ වාසනාවන්ත යුගය අවසන් වුනේ නෑ. මේ මහා භද්‍ර කල්පය අතිශයින් ම වාසනාවන්ත කල්පයක්. ඊලගට මිනිසුන් ගේ ආයුෂ අවුරුදු 20,000 වෙලා තිබෙද්දී මේ ලෝකයට ආයෙමත් බුදුරජාණන් වහන්සේ නමක් පහළ වුනා. දඹදිව කිකී නම් රාජධානියේ බ්‍රහ්මදත්ත නම් බ්‍රාහ්මණතුමා පියාණන් වෙලා ධනවතී නම් බ්‍රාහ්මණතුමිය මෑණියන් වෙලා දෙතිස් මහා පුරුෂ ලක්ෂණවලින් ශෝභමාන වූ සුන්දර බෝසත් පුතු ලොවට ලැබුනා. ඒ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ නුග රුකක් සෙවනේදී දස බිම්බරක් මාරසේනා පරාජය කරලා දස දහසක් ලෝක ධාතුව කම්පා කරගෙන සකළ ලෝකයට ම අමා සැපත සළසා දෙන්නට ඒ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වුනා. ඒ බුදුරජාණන් වහන්සේ ට තිස්ස/ භාරද්වාජ කියලා අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙනමක් වැඩ සිටියා. සර්වමිත්‍ර නමින් අග්‍ර උපස්ථායකයන් වහන්සේ නමක් වැඩ සිටියා. කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගේ කාලයේ අපේ ගෞතම බුදුරජාණන් ජෝතිපාල නමින් තරුණයෙක් ව ඉපදිලා සිටියා. ඒ බුදුරජාණන් වහන්සේ ලඟ ජෝතිපාල නමින් සිටි අපේ බුදුරජාණන් වහන්සේ පැවිදි වුනා; සසුන් බඹසර දියුණු කලා. ඒ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගෙන් මේ ලෝකයට මහා සැණසිල්ලක්, යහපතක් ලැබුනා. සත්ත්වයන් සංසාර දුකෙන් එතෙර වුනා. ජරා, ව්‍යාධි, මරණ වලින් නිදහස් වුනා. සැනසිල්ලට පත්වුනා.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ට නමස්කාර වේවා!

සදාකාලික සුවය සදනා - කාරුණික සම්බුදු රජාණෙනි
නුග රුකක් සෙවනේදී බුදුරැස් - විහිදුවා ලූ සිහ රජාණෙනි
නිවා හැම දුක් තැවුල් තිලොවේ - අමා සැප දුන් මුණි රජාණෙනි
දෑත නළලේ තබා වඳිනා - වැඳුම් පිළිගත මැන සුවාමිනි

ලොවට සැණසුම පතාගෙන වැඩි - තථාගත සම්බුදු රජාණෙනි
සැමට යහපත උදා කරනා - කාරුණික සම්බුදු රජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා - සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම - පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

## 07. ගෞතම බුදුරජාණන් වහන්සේ

පින්වත්නි,
මිනිසුන් ගේ ආයුෂ ටිකෙන් ටික අඩුවුනා. දැන් අපි ජීවත් වෙන්නේ මිනිසුන් ගේ ආයුෂ ක්‍රම ක්‍රමයෙන් අඩු වෙවී යන යුගයේ. අපේ වාසනාවට මේ මිනිසුන් ගේ ආයුෂ අඩුවෙවී යන යුගයේදීත්, මිනිසුන් ගේ ආයුෂ අවුරුදු 120 ක් වුන යුගයේ දී මීට වර්ෂ 2,632 කට කලින් තුසිත දිව්‍ය ලෝකේ ඉඳලා පස් මහ බැලුම් බලා කපිලවස්තු රාජධානියේ සුද්ධෝදන රජතුමා ගේ බිසවුන් වහන්සේ වන මහාමායා දේවිය කුස පිලිසිඳ ගත්තා අප මහ බෝසතානන් වහන්සේ. දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් ගෙන් ශෝභමාණ වූ රන්වන් රුවක් බඳු මේ සුන්දර දරු සිඟිත්තා ඉපදිලා සත් පියවරක් ඇවිදගෙන ගියා. ඒ සුන්දර බෝසත් පුතු පුරසඳ නැඟෙන්නා සේ වැඩුනා. වයස 29 දී ගිහි ජීවිතය අත් හැරියා. වයස 35 දී, මෙයට වර්ෂ 2,597 කට පෙර ගයාවේ නේරංජරා ගංතෙර ඇසතු රුක් සෙවනේ වෙසක් පුර පොහෝ දවසක දස බිම්බරක් මාර සේනාව පරාජයට පත් කරලා සකළ ක්ලේශයන් ප්‍රහාණය කරලා සම්මා සම්බුද්ධත්වයට පත්වුනා.

ඒ බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවකයින් වහන්සේලා අතර සැරියුත්/මුගලන් නමින් අග්‍ර ශ්‍රාවකයින් වහන්සේලා දෙනමක් වැඩ සිටියා. ඉතාමත් කරුණාවෙන් ආනන්ද ස්වාමීන් වහන්සේ උපස්ථාන කලා. ඒ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගේ දේශනා තමයි දැන් අපි මේ කාලයේ ශ්‍රවණය කරන්නේ. ඒ උතුම් බුද්ධ දේශනා නිසා තමයි අපි ඉගෙන ගත්තේ සසර දුකින් එතෙර වෙන්න පුළුවන් බව. ඒ බුදුරජාණන් වහන්සේ ගේ දේශනා නිසා තමයි අපි අවබෝධ කරගත්තේ මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය. ඒ බුද්ධ දේශනා නිසා තමයි රහතන් වහන්සේලා ගේ යුගයක් ගැන තොරතුරු අපි දන්නේ. ඒ බුදුරජාණන් වහන්සේ නිසා තමයි සතර අපාය ගැන තොරතුරු අපි දන්නේ. ඒ බුදුරජාණන් වහන්සේ නිසා තමයි මේ ලොව හේතු ඵල දහමක් තියන බව අපි දන්නේ. ඒ බුදුරජාණන් වහන්සේ නිසා තමයි ඒ හේතු නැති වීමෙන් ඵල නැති වන බව අපි දන්නේ. ඒ බුදුරජාණන් වහන්සේ නිසා තමයි ලොවෙහි සදාකාලික සැප වන අමා නිවණ ගැන අපි දන්නේ.

ඒ බුදුරජාණන් වහන්සේ ට, අප ගේ ශාස්තෘන් වහන්සේ ට, ගෞතම බුදුරජාණන් වහන්සේ ට අප ගේ නමස්කාරය වේවා!

පුරා දස පාරමී ගුණ දම් - ලොවට වැඩි මහ ගුණවතාණෙනි
ඇසතු රුක් සෙවනේදී බුදුරැස් - විහිදුවා ලූ දම් රජාණෙනි
නමින් ගෞතම ලෙසින් තිලොවේ - වැඳුම් ලබනා මුණි රජාණෙනි
දෑත නළලේ තබා වඳිනා - වැඳුම් පිළිගත මැන සුවාමිනි

අඳුරු වූ ලොව එළිය කරනා - මහා නුවණැති බුදුරජාණෙනි
අපට සැණසිලි සුවය සදනා - පිහිට ඔබමයි බුදුරජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා - සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම - පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

උපුටා ගැනීම
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද පින්වත් ලොකු ස්වාමීන් වහන්සේ විසින් කරන ලද **සත්බුදු වන්දනාව නම් වූ ශ්‍රව්‍ය දේශණයෙනි**

**ස්තුතිය**

01 **සත්බුදු වන්දනාව** දේශනාව අඩංගු සංයුක්ත තැටිය අප වෙත ලබාදීමට උත්සුක වූ අප කළ්‍යාණ මිත්‍ර ප්‍රසාද් විජේසූරිය පින්වත් සොහොයුරාට

**02** සකළ ලෝක සත්ත්වයා වෙත පතළ කරුණාවෙන් පරම සැපය වූ අමා නිවණට මඟ පෙන්වන මෙවන් නිර්මල, පාරිශුද්ධ බුද්ධ දේශනා ලෝකයාට මතුකොට පෙන්වන, උතුම් කළ්‍යාණ මිත්‍රයන් වහන්සේ නමක් වන **කිරිබත්ගොඩ ඤාණානන්ද අප පින්වත් ලොකු ස්වාමීන් වහන්සේ** ට මෙම කුශල කර්මය නිවන් පිණිස වීරිය වැඩි දියුණු වීමට හේතු වාසනා වේවා**!**

වහ වහා උතුම් වූ චතුරාර්ය සත්‍යය අවබෝධ වේවා**!**

මෙය අවසාන උත්පත්තිය වීමට හේතු සැළසේවා**!**

**සාදු! සාදු!! සාදු!!!**

**ගෞතම බුදු සසුණ තුල මෙත් සිතින්,**